# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2191/45 - 2020 සැප්තැම්බර් මස 04 වැනි සිකුරාදා - 2020.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති විසින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර 2019 සැප්තැම්බර් මස 21 වැනි දින අංක : 2141/88 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයෙන් 2019 සැප්තැම්බර් මස 20 වැනි දින පිහිටුවන ලද "2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ" තත් කාර්යයන් ඉටුකර එහි අවසන් වාර්තාව ඉදිරිපත් කළයුතු වන්නාවූ 2020 මාර්තු මස 20 වැනි දිනෙන් අවසන් වන මාස හයක කාලය, එකී පනතෙහි 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2020 මාර්තු මස 17 වැනි දින අංක 2167/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකෙරුණු නිවේදනයක් මගින් 2020 සැප්තැම්බර් මස 20 වැනි දින දක්වා මාස 06කින් දීර්ඝ කරන ලදුව, නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම 2020 සැප්තැම්බර් මස 20 වැනි දින සිට මාස තුනකින්, එනම් 2020 දෙසැම්බර් මස 20 වැනි දින දක්වා මෙයින් දීර්ඝ කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය

1A - G 32735 — 380 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*